# අන්තකර්රණ අධ්‍යාපනයේ මාවතට පිළිපන් පාසලක්



ඒ වෙරළබඩ නාගරික පරිසරයේ කායර් බහුලත්වය පාසලේ උස තාප්ප අතර ලෝකයට නොදැනුණු තරම් විය. පන්සියයකට වැඩි සිසුන් පිරිසක් ඉගෙනුම ලබන බව පෙනුණ ද උදේ වරුවේ පාසලෙහි වූයේ ශාන්ත සෞම්‍යබවකි.

වැඩබලන විදුහල්පතිනිය කායර් බහුලව සිටියාය. එහෙයින්, ඇය සමග සාකච්ඡා කිරීම පසුවට කල් දමා, ඇගේ අවසරය සහිතව අපි කෙළින්ම විශේෂ අධ්‍යාපන ඒකකය වෙත ගියෙමු. අප හමුවීමට පෙර ගුරුතුමිය සිසුන්ගේ කායර්යන් සංවිධානය කරන ආකාරය අපි දුටුවෙමු. ඩවුන් සින්ඩ්‍රෝම්, අධි ක්‍රියාකාරී, ඔටිසම්, බුද්ධිමය දුබලතා සහ බහුවිධ දුබලතා සහිත ළමුන් අටදෙනෙකුට විවිධ ක්‍රියාකාරකම් පැවරූ ඇය කායර් බහුලත්වය මැද සිනාමුසු මුහුණින් අප පිළිගත්තාය.

"මා මේ පාසලට ඇවිත් අවුරුදු 11ක් වෙනවා. මීට කලින් පාසල් දෙකක සේවය කළා. සේවයට බැඳිලා අවුරුදු 25ක් වෙනවා. මහරගම ගුරු විද්‍යාලයෙන් විශේෂ අධ්‍යාපන ගුරු පුහුණුව ලැබුවා. මේ විශේෂ අධ්‍යාපන ඒකකය ආරම්භ කර මා තමයි තනිවම මුල සිටම එහි කටයුතු කරගෙන ආවේ," යි ගුරුතුමිය අපට පැවසුවාය.

ඇගේ සිසුන්ගේ මට්ටම අනුව එකිනෙකාට ගැලපෙන ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇය පවරා තිබිණි. බොත්තම් දැමීම හා ගැලවීම, තනිව ජැකට්ටුවක් ඇඳගැනීම, සරල මැහුම්, කාඩ්පත්වල පිංතූර වගර් කිරීම මෙන්ම අකුරු ලිවීමට පුහුණු වීම ද ඔවුහු කළහ. සෑම සිසුවෙකුටම ඔවුන්ගේ බුද්ධි මට්ටම අනුව කළ හැකි ක්‍රියාකාරකම් වෙන වෙනම සැලසුම් කර තිබිණි. සිසුන් එකිනෙකාට වෙන වෙනම ගුරුවරියගේ අවධානය යොමු විය. දුෂ්කර කායර්යක් වුවත්, ඇය එය සතුටින්, සැහැල්ලුවෙන් ඉටු කළාය.

"මේ වෙනකොට විශේෂ අධ්‍යාපන ඒකකයේ සිසුන් හතරදෙනෙකු සාමාන්‍ය පන්ති කාමරවල ඒකීයකරණය කර තිබෙනවා. ඔවුන් යම් කාලයක් විශේෂ අධ්‍යාපන ඒකකය තුළ සූදානම් කිරීමෙන් අනතුරුව පළමු ශ්‍රේණියේ සිටම සාමාන්‍ය පන්තිවල ඉගෙනුම ලැබුවා. මේ වෙනකොට දෙදෙනෙක් අටවන ශ්‍රේණියේ ඉගෙනුම ලබනවා. තවත් සිසුවියක හත්වන ශ්‍රේණියේ ඉගෙනුම ලබනවා. බහුවිධ ආබාධ සහිතව ඒකීයකරණය සිදුකළ හයවන ශ්‍රේණියේ සිසුවා මේ දිනවල අසනීප තත්වයක් නිසා තාවකාලිකව පාසල් එන්නේ නැහැ. ඒ සිසුවා බුද්ධිමය වශයෙන් විශාල ප්‍රගතියක් පෙන්නුවා. ඒකීයකරණය කර හත්වන ශ්‍රේණියේ ඉගෙනුම ලබමින් සිටි තවත් සිසුවියක් දැන් පාසල් එන්නෙ නැහැ. ඇයට දැන් වයස අවුරුදු 18ක් වෙනවා. ඇගේ මව කිව්වා, ළමයාව වෘත්තීය අධ්‍යාපනයට යොමුකරන බව."

ලිවීම, කියවීම, සවන් දීම වැනි අධ්‍යාපනික කුසලතාවලට අමතරව ජීවන කුසලතා හා මූලික වෘත්තීය පුහුණුව ද විශේෂ අධ්‍යාපන ඒකකය සිසුන්ට ලබාදෙයි.

“ඇඟිලි කපාගන්නෙ නැතුව එළවළු කපන හැටි, ඇනු වගේ දේවල් ඇස්වලින් කඳුළු නොඑන්න සුද්ද කරන හැටි, ඉවුම් පිහුම් කරන හැටි, ගෑස් ලිප පත්තු කරන හැටි, ගින්දර සමග අනතුරු කරගන්නේ නැතුව කටයුතු කරන හැටි මම පාසලේදී ළමයින්ට උගන්වනවා. ලුණු රස, ඇඹුල් රස පාලනය කරන හැටි වගේ දේත් පුහුණු කරනවා. මේ පන්තියේ ඉගෙනගත් ළමයින් අම්මාට ඉවුම් පිහුම්වලදී උදව් කරන බව අම්මලා මට කියනවා. ඒ අයට තනිව තමන්ගේ වැඩ කරගන්න හැටි අපි පුහුණු කරනවා. රෙදි නවන හැටි, පිළිවෙලට තියන හැටි වගේ දේත් කියා දෙනවා. ඒ වගේම මම ඔවුන්ට මහන්න උගන්නනවා. ඉදිකටුව පාවිච්චි කරන හැටි, නිමර්ාණ කරන හැටි පුහුණු කරනවා. මේ මූලික පුහුණුවීම් දීසර්කාලීනව වැදගත් වෙනවා.”

විශේෂ අධ්‍යාපන ඒකකයෙන් අධ්‍යාපනය ලබා පිටව ගිය සිසුන් යම් යම් වෘත්තීය පුහුණුවීම්වලට යොමු වී ඇති බව ද ගුරුතුමිය පැවසුවාය.

අන්තකර්රණ අධ්‍යාපනයේදි සෑම සිසුවෙකුගේම විශේෂතා අනුව, ඔවුන් සියලු දෙනාට වෙන වෙනම අවධානය යොමු කළ යුතු බව ගුරුතුමිය අවධාරණය කළාය.

“චිත්‍රයක් අඳිනකොට වුණත් එහෙමයි. සමහරුන්ට අඳින්න පුළුවන්. සමහරුන්ට ඇඳලා පාට කරන්නත් පුළුවන්. සමහරුන්ට ඇඳලා දෙන්න ඕනෑ පාට කරන්න. හැමෝටම පොදුවෙ එක දෙයක් උගන්නන්න බැහැ. එක එක්කෙනාට වෙන වෙනම සැලසුම් කරලා අධ්‍යාපනය ලබාදෙන්නට ඕනෑ.”

අධ්‍යාපන දෙපාතර්මේන්තුව විශේෂ අධ්‍යාපන ගුරුවරුන්ට බොහෝ පුහුණුවීම් ලබාදී ඇති බව ගුරුතුමිය පැවසුවාය.

“පුහුණුවට අමතරව, අපේ අත්දැකීම් හා නිමර්ාණශීලීත්වයත් ඉතා වැදගත් වෙනවා. යෝග්‍ය කාලයක් විශේෂ අධ්‍යාපන ඒකකය තුළ සූදානම් කිරීමෙන් පසුව හැකි හැම සිසුවෙකුම සාමාන්‍ය සිසුන් සමග ඒකීයකරණය කරනවා. සාමාන්‍ය පන්තිවලට ඇතුළත් කළත්, ඒ පන්තිවල ගුරුවරිය ඔවුන්ට විශේෂ අවධානය යොමු කරනවා. විශේෂ අධ්‍යාපන ගුරුවරිය ලෙස මාත් කාලයක් යනකල්ම ඒ සිසුන් කෙරෙහි අවධානය යොමු කරනවා. ගුරුවරුන් ඒ සඳහා සහයෝගයෙන් කටයුතු කරනවා. ඔවුන් ද අන්තකර්රණ අධ්‍යාපනය පිළිබඳව දැනුවත් කර තිබෙනවා.”

ඒකීයකරණය කර තිබෙන සිසුන් වෙත පාසල විසින් විශේෂ අවධානයක් යොමු කර තිබේ. ක්‍රීඩා උත්සව, විවිධ ප්‍රසංග, උදය රැස්වීම් ආදී සෑම අවස්ථාවකදීම ඔවුන්ට අවස්ථාව ලබාදෙයි. ඔවුන් සම්බන්ධයෙන් සෙසු ගුරුවරුන්ගේ, සිසුන්ගේ හා මව්පියන්ගේ ආකල්ප වෙනස් කිරීමට පාසලේ පරිපාලනය දීසර් කාලයක් තිස්සේ විශේෂ වැඩ කොටසක් ඉටු කරන ලදී. වතර්මානය වන විට, සමස්ත පාසලම අන්තකර්රණය වෙත මනාව නම්නීකරණය වී තිබේ.

ඒකීයකරණ අධ්‍යාපනය යනු විශේෂිත ගුරුවරුන්ගේ හෝ සහායකයන්ගේ සහාය ඇතිව සාමාන්‍ය අධ්‍යාපන පන්තිකාමරවල දුබලතා සහිත සිසුන් ස්ථානගත කිරීම අරමුණු කරගත් ප්‍රවේශයකි. ඒකාබද්ධ අධ්‍යාපනයේ පරමාථර්ය වන්නේ ආබාධ සහිත සිසුන්ට ඔවුන්ගේ සම වයසේ මිතුරන්ට සමාන අධ්‍යාපනික අත්දැකීම් ලබා දීමයි.

අන්තකර්රණ අධ්‍යාපනය යනු සිසුන්ගේ හැකියාවන් හෝ දුබලතා නොසලකා, සියලු සිසුන් පිළිගන්නා සහ සහයෝගය දක්වන පාසල් පරිසරයක් නිමර්ාණය කිරීම අරමුණු කරගත් වඩාත් පුළුල් ප්‍රවේශයකි. අන්තකර්රණ අධ්‍යාපනයේ පරමාථර්ය වන්නේ සියලුම සිසුන්ට ඔවුන්ගේ පුද්ගල අවශ්‍යතා කුමක් වුවත් පාසලට සහභාගී වීමට සහ සාථර්ක වීමට අවස්ථාව ඇති බව සහතික කිරීමයි.

විශේෂ අධ්‍යාපන ඒකකයේ වසර කීපයක සංවධර්නයෙන් පසු පළමු ශ්‍රේණියේ සිට අන්තකර්රණ අධ්‍යාපනය ඔස්සේ ඉදිරියට ගිය සෙනුරි මේ වන විට ඉගෙනුම ලබන්නේ හත්වන ශ්‍රේණියේයි. බුද්ධිමය ඌනතා සහිත සිසුවියක වන 14 හැවිරිදි සෙනුරි ක්‍රීඩාවට හා නැටුමට දක්ෂය. ඇය පාසලේ ක්‍රීඩා තරගවලට ද සහභාගී වේ. විශේෂ අධ්‍යාපන සිසුන් සඳහා වන ක්‍රීඩා තරගවලදී දිවීමේ හා පැනීමේ ඉසව්වලින් පළාත්

මට්ටම නියෝජනය කර ජයග්‍රහණය කර තිබේ. “මට පන්තියේ ඔක්කොම ළමයින්ට වඩා හයියෙන් දුවන්න පුළුවන්,” ඇය කීවාය.

“දුවගේ වර්ධනය සඳහා පාසලෙන් දක්වපු සහයෝගය අති විශාලයි,” යි සෙනුරිගේ මව කීවාය. “දුවට මතක තබාගැනීමේ ගැටලු තිබෙනවා. ඒ වුණත්, දුවන්න, පනින්න, සෙල්ලම් කරන්න, නටන්න හරි කැමැත්තෙන් ඉදිරිපත් වෙනවා. පාසලෙන් ඇයට ඒ සඳහා අවස්ථා ලබාදෙනවා. පහ ශ්‍රේණිය දක්වා එකම ගුරුවරියකගෙන් දවස පුරා ඉගෙන ගත්ත දුව තවම කාල පරිච්ඡේදයෙන් පරිච්ඡේදයට ගුරුවරුන් මාරු වෙන අලුත් ක්‍රමයට හුරු වෙමිනුයි ඉන්නෙ. ඉගෙනගන්නේ හෙමින් වුණත්, පන්තියේ යහළුවන් එක්ක ඇය හරිම සතුටින් ඉන්නෙ.”

අටවන ශ්‍රේණියේ අධ්‍යාපනය ලබන 16 හැවිරිදි මනුත් හමුවීමට ද අපි ගියෙමු. අධි ක්‍රියාකාරී ළමයකු වූ ඔහු අද වන විට පාසලේ ඒකීයකරණ අධ්‍යාපනය මගින් උපරිම ප්‍රතිඵල නෙළාගත් සිසුවෙකි. ඔහු සාමාන්‍ය සිසුන් සමග මනාව මුසුව ඉගෙනුම ලබමින් සිටින අයුරු අපි නිරීක්ෂණය කළෙමු.

අන්තකර්රණ අධ්‍යාපනය ආබාධ සහිත සිසුන්ගේ ස්වාධීනත්වය සහ ආත්ම විශ්වාසය වර්ධනය කිරීමට උපකාරී වන බව පාසලේ විදුහල්පතිතුමිය පැවසුවාය. “එය ඔවුන්ට සමාජ කුසලතා ගොඩනඟා ගැනීමට සහ මිතුරන් ඇති කර ගැනීමට ද උපකාරී වෙනවා. සෙසු සිසුන් තුළ අන් අය කෙරෙහි සංවේදනය සහ අවබෝධය වර්ධනය කිරීමට ද මිනිස් අත්දැකීම්වල විවිධත්වය අගය කිරීමට ද අන්තකර්රණ අධ්‍යාපනය උපකාරී වෙනවා,” යි ඇය පෙන්වා දුන්නාය. සිය පාසලේ විශේෂ අධ්‍යාපන ගුරුවරියගේ කාය‌ර්භාරය හා පාසල අන්තකර්රණ අධ්‍යාපනයට යොමු කිරීමට හැකි වීම පිළිබඳ ඇය අදහස් ඉදිරිපත් කළේ අභිමානයෙනි.

අන්තකර්රණ අධ්‍යාපනය සාථර්ක වීමට නම් පාසල් සහ ගුරුවරුන් තම ඉගැන්වීමේ ක්‍රම අනුවතර්නය කරගැනීමට කැමති විය යුතුය. ආබාධ සහිත සිසුන්ට අමතර සහයෝගයක් ලබා දීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, අන්තකර්රණ අධ්‍යාපනයේ ප්‍රතිලාභ අභියෝගවලට වඩා බෙහෙවින් වැඩි ය. එය සාධාරණ හා ඵලදායී අධ්‍යාපන ආකෘතියකි. සියලුම සිසුන්ට ඔවුන්ගේ සම්පූණර් හැකියාවන් කරා ළඟා වීමට අවස්ථාව ඇති බව සහතික කිරීමට හොඳම ක්‍රමය අන්තකර්රණ අධ්‍යාපනයයි.